# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2064/7 - 2018 මාර්තු මස 26 වැනි සඳුදා - 2018.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට රුවන්වැල්ල ජල යෝජනා ක්‍රමයේ ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මාර්තු මස 13 වැනි දින,
අංක 35, "ලක්දිය මැඳුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1329.

#### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාහල්ල ග්‍රාම නිලධාරී වසමේ මොරලිය ගමේ පිහිටි රුවන්වැල්ල වත්ත නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 02 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | ඃ | ප්‍රාදේශීය සභා පාර ; |
| *දකුණට* | ඃ | ප්‍රාදේශීය සභා පාර හා මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | ඃ | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* ඃ 01. ප්‍රධාන විධායක නිලධාරී
සි/ස මල්වත්ත වැවිලි සමාගම
අංක 280,
ධර්ම වීදිය,
කොළඹ 12.

04 - 377

1A - G 27358 — 29 (2018/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට බද්දේගම ජල සම්පාදන ක්‍රමය යටතේ ජල තටාකය ඉදිකිරීමට යෝජිත ඉඩමට යන ප්‍රවේශ මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මාර්තු මස 13 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1296.

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 184 A, නයාපාමුල ග්‍රාම නිලධාරි වසමේ බද්දේගම නයාපාමුල, ගමේ පිහිටි කන්දේ අද්දරවත්ත නැමැති බලයලත් මිනින්දෝරු ඥාණසිරි දහනායක මහතා විසින් 2013.09.10 දිනැතිව සකස් කරන ලද අංක 2013/050 දරන සැලැස්මේ කැබිලි අංක 4 A ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0025 (පර්චස් : 0.98) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඩී. ජී. වයි. අයි. අබේරත්න හිමිකම් කියන අංක 4 ඉඩම් කැබැල්ලේ කොටසක් ; |
| *නැගෙනහිරට* | : | බද්දේගම සිට නයාපාමුල දක්වා වූ ප්‍රධාන මාර්ගයට වෙහෙරමළුවේ සිට යන පාර ; |
| *දකුණට* | : | බද්දේගම සිට නයාපාමුල දක්වා වූ ප්‍රධාන මාර්ගයට වෙහෙරමළුවේ සිට යන පාර ; |
| *බටහිරට* | : | ඩී. ජී. වයි. අයි. අබේරත්න හිමිකම් කියන අංක 4 ඉඩම් කැබැල්ලේ කොටසක්. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : ඩී. ජී. වයි. අයි. අබේරත්න මහතා
කන්දේ අද්දර වත්ත
දූල්කඩ,
බද්දේගම

04 - 378

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.